# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1996/9 - 2016 දෙසැම්බර් මස 05 වැනි සඳුදා - 2016.12.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, ගුරුදෙණිය සේවා ජලාශය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය ව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 නොවැම්බර් මස 29 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1251.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 279, මාළිගාතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගුරුදෙණිය ගමේ පිහිටි, අංක 5850 C දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 47, 48, 49 හා කැබලි අංක 51 න් කොටසක් ලෙස දක්වෙන ''මවුන්ට් පැරඩයිස්'' නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 28.25 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් හතර :

කැබලි අංක 47
ඉඩමේ නම : මවුන්ට් පැරඩයිස්
ප්‍රමාණය : පර්චස් 17
මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඉඩමේ ප්‍රවේශ මාර්ගය හා මෙම සැලැස්මේ කැබලි අංක 48 ; |
| *නැගෙනහිරට* | : | අත්පත් කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 48 හා 51 ; |
| *දකුණට* | : | අත්පත් කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 51 හා ගල්වල වත්ත ; |
| *බටහිරට* | : | මෙම සැලැස්මේ කැබලි අංක 42 හා ගල්වල වත්ත. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. අයි. ගුණසේන මහතා,
අංක 65, සුමංගල මාවත,
කුරුණෑගල.

1A - G 24687 — 29 (2016/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කැබලි අංක 48
ඉඩමේ නම : මවුන්ට් පැරඩයිස්
ප්‍රමාණය : පර්චස් 15.25
මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඉඩමේ ප්‍රවේශ මාර්ගය හා මෙම සැලැස්මේ කැබලි අංක 49 ; |
| *නැගෙනහිරට* | : | අත්පත් කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 49 ; |
| *දකුණට* | : | අත්පත් කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 51 හා කැබලි අංක 47 ; |
| *බටහිරට* | : | අත්පත් කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 47 හා ඉඩමේ ප්‍රවේශ මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. වයි. එම්. සෝමපාල මහතා,
අංක 1/15, පාසැල් පටුමග,
වෙලගෙදර,
බදුල්ල.

කැබලි අංක 49
ඉඩමේ නම : මවුන්ට් පැරඩයිස්
ප්‍රමාණය : පර්චස් 15
මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ප්‍රවේශ මාර්ගය හා මෙම සැලැස්මේ කැබලි අංක 50 ; |
| *නැගෙනහිරට* | : | අත් පත් කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 51 සහ මෙම සැලැස්මේ කැබලි අංක 50 ; |
| *දකුණට* | : | අත් පත් කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 51 හා කැබලි අංක 49 ; |
| *බටහිරට* | : | අත්පත් කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 48 හා ඉඩමේ ප්‍රවේශ මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. වයි. එම්. සෝමපාල මහතා,
අංක 1/15, පාසැල් පටුමග,
වෙලගෙදර,
බදුල්ල.

කැබලි අංක 51 (කොටසක්)
ඉඩමේ නම : මවුන්ට් පැරඩයිස්
ප්‍රමාණය : පර්චස් 21
මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | අත්කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 47, 48, 49 හා කැබලි අංක 51 හි ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | ගල්වල වත්ත ; |
| *බටහිරට* | : | අත්කර ගැනීමට යෝජිත මෙම සැලැස්මේ කැබලි අංක 47, 48 හා 49. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ද ෆිනෑන්ස් (පී. එල්. සී.) සමාගම,
අංක 55, ලෝරිස් පෙදෙස,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘති අදියර II යටතේ දූල්කඩ භූගත ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 නොවැම්බර් මස 29 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1224.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 644C, රද්දෙගොඩ ග්‍රාම නිලධාරි වසමේ තොටුපිටියාවත්ත ගමේ පිහිටි ජෙකොබ්වත්ත නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 400 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | පරගස්තොට - දූල්කඩ පාර ; |
| *නැගෙනහිරට* | ඃ | මැක්ටයිල් කර්මාන්තායතන ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | ඃ | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | ඃ | හිමිකරුවන් නොදන්නා යාබද ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය* ඃ 01. බාලන් ආශිර්වාදන් මහතා,
ජෙකොබ්වත්ත,
අක්කර 22,
තොටුපිටියවත්ත - මිල්ලනිය.

12 - 803

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.